# ශ්‍රී සුළු ගුළු රජමහා විහාරය පිළිබඳ මානවවංශ පුරාවිද්‍යාත්මක අධ්‍යයනයක්

කේ.ඒ.එන්. දමයන්ති

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. niluka059@ gmail.com

**ප්‍රමුඛ පදඃ ගව්ව, බෝධි ප්‍රාකාරය, පඩුපෙවු, අංකුරය, භෂ්මාවශේෂ**

## හැඳින්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රිකයේ, නිකවැරටිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ, කඩවලගෙදර ග්‍රාමසේවා වසමට අයත් මහගිරිල්ල ග්‍රාමයේ සුළු ගුළු රජමහා විහාරය පිහිටා ඇත.

මෙම විහාරයෙහි ඉතිහාසය මහින්දාගමනය තෙක් අතීතයට දිව යයි. ක්‍රි . පූ 307 - 260 දී දෙවනපෑතිස් රජු විසින් ඉදිකරන ලද සිද්ධස්ථානයක් ලෙස මෙම ස්ථානය සැලකේ. ගව්වෙන් ගව්ව විහාර ඉදි වූ එම යුගයේ අහඹු සිද්ධියක් මුල් කර මෙම විහාරස්ථානය ඉදි කළ බව ඉතිහාසයේ දක්වයි. අනුරාධපුර නගරයේ සිට දෑදිගම පුරය දක්වා බෝධි අංකුරයක් වැඩමවාගන යද්දි රෑ බෝ වීම නිසා පිරිස මෙම ස්ථානයේ බෝධි අංකුරය සහිත පාත්‍රය තබා රැය පහන් කර ඇත. පසු දින වන විට එය එස විය නොහැකි ලෙස මුල් ඇද ඇත. දෙවනපෑතිස් රජු එතැන බෝධිප්‍රාකාරයක් ඉදිකර විහාරස්ථානයකට අඩිතාලම දමා ඇත.

සුළු ගුළු රජමහා විහාරය පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, කලාත්මක යන අංශයන්ගෙන් ඉතා වැදගත් ස්ථානයකි. එහි ඇති පුරාවිද්‍යාත්මක නිර්මිතයන් සහ ඒ හා බැඳුණු මානවවංශ විද්‍යාත්මක උරුමය ඇසුරින් කුමන අවධි නියෝජනය කරන්නේද? යන්න හඳුනාගන අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණය. ඉහත ප්‍රධාන අරමුණ ඉටුකර ගැනීමේ දි සාධනය කරගත යුතු සෙසු අරමුණු ලෙස

- වැළලි ඇති පුරාවිද්‍යාත්මක සාධක අනාවරණය කර ගැනීම
- මෙම ස්ථානයේ පුරාවිද්‍යාත්මක වැදගත්කම හඳුනාගැනීම
- මෙම ස්ථානයේ දියුණුව සඳහා යෝජනාවලියක් සැකසීම
- අප්‍රසිද්ධියට පත් මෙම පුරාස්ථානය ප්‍රසිද්ධ කිරීම
- විනාශ වෙමින් පවතින මෙම ස්ථානය පිළිබඳ බලධාරීන්ගේ අවධානය යොමු කරවීම

යන කරුණු පෙන්වා දිය හැකිය.

## ක්‍රමවේදය

සුළු ගුළු රජමහා විහාරය පිළිබඳව පුරාවිද්‍යාත්මකව අධ්‍යයනය කිරීමේ දි ප්‍රථමයෙන් අධ්‍යයන සීමාවක් වෙන්කර ගන්නා ලදි. ඒ අනුව මුලින්ම භූමිය පිළිබඳ සීමාවක් ඇති කරගන්නා ලදි. විශාල භූමි ප්‍රදේශයක් පුරා පැතිරුණු විහාර බිම තුළින් පුරාවිද්‍යාත්මක සාධක විසිරී ඇති අක්කර පහක පමණ භූමිය අධ්‍යයන සීමාව ලෙස තෝරාගන්නා ලදි. මීලගට කාලය පිළිබඳ සීමාවක් ඇතිකරගන්නා ලදි. ඓතිහාසික මූලාශ්‍ර වලට අනුව සුළු ගුළු රජමහා විහාරයේ ආරම්භය අනුරාධපුර යුගයට අයත් වේ. අවසාන අවධිය ලෙස මහනුවර යුගය හඳුනාගත හැකිය. ඒ අනුව අධ්‍යයන

කාලසීමාව ලෙස අනුරාධපුර යුගයේ සිට මහනුවර යුගය දක්වා කාලය අයත් වේ.

මෙම විහාරස්ථානය පුරාවිද්‍යාත්මක වශයෙන් අධ්‍යයනය කිරීමේ දී මුලින්ම මූලාශ්‍ර අධ්‍යයනය කිරීම, ගවේෂණය කිරීම සිදු කරන ලදි. මෙහිදි ප්‍රාථමික ද්විතීක මූලාශ්‍ර උපයෝගි කර ගන්නා ලදි. ඊට අමතරව සිතියම්, ඡායාරූප, සැලසුම් ආදියත් අන්තර්ජාලමය තොරතුරුත් විමර්ෂණයේදි වඩාත් ප්‍රයෝජනවත් විය. ඇතැම් වැදගත් ජනප්‍රවාදාත්මක තොරතුරු ලබාගැනීම සඳහා සම්මුඛ සාකච්ඡා පවත්වන ලදි. පුරාවිද්‍යාත්මක සාධක හදුනාගැනීමේ දි ක්ෂේත්‍රය සමග සෘජුවම සම්බන්ද වි නිරික්ෂණය කරන ලදි. මෙහිදි නියමිත දිශාව හඳුනාගන පරිමාව දක්වමින් ඡායාරූප මගින් වාර්තා කිරීම සිදු කර ඇත. වැදගත් තොරතුරු ලේඛනගත කිරීම සිදු කරන ලදි. පුරාවස්තුවල සැලසුම් පරිමාණයට අනුව අදින ලදි.

ඉහත සියලුම ආකාරයෙන් ලබාගන්නා දත්ත දිවයිනේ වෙනත් රජමහා විහාරවල විවිධ යුගවලින් හමු වූ සාධක සමග සන්සන්දනය කරමින් විශ්ලේෂණය කර ඇත. ඒ අනුව සුළු ගුළු රජමහා විහාරය තුළ කුමන අවධි වලට අයත් සාධක ශේෂ කර ඇත්දැයි හඳුනා ගත හැකිය.

ඉහත සියලු ආකාරයෙක් අත්පත් කරගන්නා ලද තොරතුරු විශ්ලේෂණය කර ඉදිරිපත් කිරීම වගු, සිතියම්, සැලසුම්, ඡායාරූප, යොදාගත් ඉදිරිපත් කිරීමක් මගින් සිදු කර ඇත.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

පුරාවිද්‍යාත්මක, ඓතිහාසික, කලාත්මක යන අංශයන්ගෙන් වැදගත් දර්ශනිය වටපිටාවකින් යුත් මෙම විහාරස්ථානය තුළ ඉපැරණි ටැම්පිට විහාරයක්, චෛත්‍යයක්, බෝධි වෘක්ෂයක්, පොකුණක්, ශෛලමය මල් ආසන හතරක්, වැසිකිලි ගලක්, රහතන් වහන්සේලා සිවුරු පඬුපෙවූ ශෛලමය බේසමක්, ශ්‍රී පාද ලාංඡන සහිත ගල් පුවරු තුනක් සහ සෙල්ලිපියක් දක්නට ලැබේ. කිසිවෙකුගේ අවධානයට හසු නොවූ මෙම ස්ථානය ඓතිහාසික මහින්දාගමනයෙන් ඇරඹී සිංහලේ අවසන් රජු වූ කීර්ති ශ්‍රී රාජසිංහ රජු දක්වා අතීතයකට දිව යයි.

මෙම පර්යේෂණය තුළින් අනුරාධපුර යුගයේ සිට මේ දක්වා විවිධ පුරාවිද්‍යාත්මක සාධක හඳුනාගැනීමට හැකියාව ලැබි ඇත. ඒ අතර මෙම විහාරස්ථානය බිහි වීමට පදනම වූ බෝධි රෝපණය පිළිබඳ සිදුවීම පැහැදිලිවම අනුරාධපුර යුගයට අයත් වේ. මක්නිසාදයත් දෙවන පැතිස් රජු දවස මෙම සිදුවීම වූ බව ඉතිහාසයේ සඳහන්වීමත් දෙවන පැතිස් රජු අනුරාධපුර යුගයේ පාලන තන්ත්‍රය හෙබවූ රජකු වීමත්ය. පසේබුදුවරයකුගේ භෂ්මාවශේෂ තැම්පත් කර මෙහි චෛත්‍යයක් ඉදිකර ඇති බවට පුරාවිද්‍යාත්මක සාධක කිහිපයක් ඇත. නිකවැරටිය දනිකිතව සිට අඹන්පොල හරහා දිවෙන ප්‍රධාන මාර්ගයේ සවරංගල නමැති ප්‍රදේශයේ දිග්ගල ගල් තලාවේ ඇති ශිලා ලේඛනයට අනුව මෙම ප්‍රදේශයේ පසේබුදුවරයකු සිට ඇත. මහ ගිරිල්ල හිදෝගම වැව පාමුල ටැම් ලිපියක "දසමක පංචක බුධහෙ ථු ටෙ" නමින් වැකියක් ඇති අතර ඉන් මෙකල දසවන පසේබුදුරජාණන් වහන්සේගේ භෂ්මාවශේෂ තැම්පත් කළ සොහොන් කොතක් පසුව වෙහෙරක් වි ඇති බව දක්වා ඇත. කාලය සහ චෛත්‍යයේ සැලැස්ම අනුව ඒ මෙහි ඇති චෛත්‍යය බව අනුමාණ කළ හැකිය. ඉසිගිලි සූත්‍රයට අනුව දසවන පසේබුදුන් "තිථ" නම් වන අතර එම භෂ්මාවශේෂ තිථ පසේබුදුන්ගේ බව පැහැදිලිය. මෙම ස්තූපය අනුරාධපුර යුගයේ රජ කළ දුටුගැමුණු රජු විසින් පිළිසකර කර ඇත. ක්‍රි . පූ 137 - 119 සද්ධාතිස්ස රජු භෂ්මාවශේෂ සහිත

ස්මාරකය අංග සම්පූර්ණ චෛත්‍යයක් ලෙස පුළුල් කොට නම් කර ඇත.

වට්ටාරම රජමහා විහාරයේ වාසය කළ මලියදේව මහරහතන් වහන්සේ සහ උපස්ථායක සුළු ගුළු උපාසක නිතර මෙහි පැමිණ ඇත. එබැවින් මුලින් මහා විහාරය නමින් හැඳින් වූ මෙම ස්ථානය පසුව සුළු ගුළු රජමහා විහාරය වී ඇත. මලියදේව මහරහතන් වහන්සේ සහ උපස්ථායක සුළු ගුළු උපාසක වාසය කර ඇත්තේද අනුරාධපුර යුගයේදීය. ක්‍රි . පූ 161 - 137 දුටුගැමුණු රජු දවස මෙම ස්ථානය දියුණු වි ඇත. පසුකාලීනව වළගම්බා රජු, ගජබා රජු, බාතිය තිස්ස රජු, බුද්ධදාස රජු, අග්බෝ රජු යන රජවරුද මෙම ස්ථානයට අනුග්‍රහය ලබා දී ඇත. ඒ අනුව අනුරාධපුර යුගයට අයත් සාධක බහුලව මෙහි දක්නට ලැබේ.

පොළොන්නරුව මහා පරාක්‍රමබාහු රජු, යාපහුව රජ කළ බුවනෙකබාහු රජු, කන්ද උඩරට රජකළ පළමුවන විමලධර්මසූරිය රජු, කිර්ති ශ්‍රි රාජසිංහ රජු යන රජවරුන් විසින් සුළු ගුළු රජමහා විහාරයේ දියුණුවට කටයුතු කර ඇත. ඒ අනුව පොළොන්නරුව, යාපහුව හා මහනුවර අවධිවල ද මෙම විහාරස්ථානයට වැදගත් තැනක් හිමි වී ඇති බව පැහැදිලිය. ටැම්පිට විහාර නිර්මාණය කිරීම මහනුවර යුගයේ බහුලව සිදු වී ඇත. මෙහි ඇති ටැම්පිට විහාරයේ සිතුවම් ද මහනුවර යුගයේ සිතුවම් ශෛලියට සමානය.

මේ අනුව අවධි ගණනාවක් නියෝජනය කරන වටිනා පුරාවිද්‍යාත්මක සාධක රැසක් සුළු ගුළු රජමහා විහාර පරිශ්‍රයේ ශේෂව ඇත. කිසිවෙකුවෙකුගේ අවධානයට හසු නොවී වල් වැදී ඇති අතීත උරුමයන් අනාගත පරපුරට සුරැකීම කාලීන අවශ්‍යතාවයකි.

*ආශ්‍රිත ග්‍රන්ථ*

ඒකනායක කපුරුබණ්ඩා, ටී.ඩී. (2017) *ශ්‍රී සුළු ගුළු වෙහෙර වරුණ.* චාමර ප්‍රින්ටර්ස්, නිකවැරටිය.